**ශීර්ෂය 133 - තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූනි 23 දින අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධි විධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,917.10 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,655.82 ක් උපයෝජනය කර තිබුණි.

ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 261.28 ක් හෙවත් සියයට 7 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,396.13 | 1,285.91 | 110.22 | 7.89 |
| මූලධන | 2,520.97 | 2,369.91 | 151.06 | 5.99 |
| **එකතුව** | **3,917.10** | **3,655.82** | **261.28** | **6.67** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 13301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලයන | රු.මිලියන | රු.මිලියන |
| 24.00 | 24.22 | 10.00 | 13.55 | 75.00 | 59.09 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 12.83 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන්වූ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ශීර්ෂය 133 - තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 6 ක් සඳහා සළසා තිබුණු රු.9,623,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 40 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය සඳහා පවත්වා තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

නැනෝ තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීම සඳහා ලබා ගෙන තිබුණු අක්කර 50 ක ඉඩම වෙනුවෙන් රු.මිලියන 304.07ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. එම ඉඩමෙන් අක්කර 48 ක් පමණක් ලබාදී තිබුණු අතර භූමියේ අයිතිය විධිමත් ලෙස

පවරාගෙන නොතිබුණු ඉඩමෙහි රු.මිලියන 823.6 ක් වැය කර තාක්ෂණ උද්‍යානය ස්ථාපිත කර තිබුණි.

### 3.4 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්, ව්‍යාපෘති නියමිත දින ආරම්භ නොකිරීම, කාල පමාවකින් පසු වැඩ ආරම්භ කිරීමේ ව්‍යාපෘති පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

#### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

රිදීමාලියද්ද විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේ විද්‍යාතා නිලධාරියෙකුගේ පුරප්පාඩුව නිසා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉදිකිරීමට යෝජිතව තිබූ ගොඩනැගිල්ල ඉදිකිරිම ආරම්භ කර නොතිබුණි.

#### (ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ඉටු කිරීමට ප්‍රමාද වී තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | 2014 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | |
| මුසලි විද්‍යාතා සම්පත් මද්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම. | 8,163,058 | 2012 ජනවාරි | 2012 සැප්තැම්බර් 14 | නිමකර නැත | 2,869,816 | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී වීම නිසා 2014 වර්ෂයට අවිච්ඡින්න කර තිබුණද, 2014 වර්ෂයේදිද එහි වැඩ නිමකර නොතිබුණි. |
| ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය විද්‍යා හා තාක්ෂණ සහයෝගිතා වැඩසටහන. | 64,132,600 | 2011 සැප්තැම්බර් 22 | 2014 සැප්තැම්බර් 22 | නිමකර නැත | 31,588,178 | විශේෂඥවරයන්ගේ ඌණතාවය හා අධික කාර්ය බහුලත්වය. |

#### (ඇ) ව්‍යපෘති නියමිත දින ආරම්භ නොකිරීම

පහත සඳහන් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීමට යෝජිතව තිබුණද, 2015 ජුනි 23 දින වන විටත් ඉදිකිරිම් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

- කොටවෙහෙර
- මන්නාරම නගරය
- මාලිම්බඩ

**(ඇ) කාල පමාවකින් පසු වැඩ ආරම්භ කිරීමේ ව්‍යාපෘති**

පහත සඳහන් විදාතා සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීමට යෝජිතව තිබුණද, ඒවායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම 2015 වර්ෂයට කල්දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තිමේන්තුගත මුදල | 2014 දෙසැම්බර් 31 දිනට වියදම |
|---|---|---|
| | රු. | රු. |
| පාදුක්ක | 8,242,646 | 3,000,000 |
| සන්දිලිපායි | 9,446,694 | 2,000,000 |
| සයින්දමරුදු | 9,855,124 | 2,000,000 |
| නල්ලූර් | 9,195,599 | 2,000,000 |
| කහවත්ත | 6,565,376 | 2,000,000 |

**3.5 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ලගාකර ගත් ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අදාලව පහත සඳහන් කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණි.

| | විදාතා වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| (i) | විදාතා ව්‍යවසායකත්ව සංගම් ඇතිකිරීම | | |
| | • ජාතික මට්ටම | 1 | නැත |
| | • දිස්ත්‍රික් මට්ටම | 22 | 16 |
| | • විදාතා මට්ටම | 260 | 200 |
| (ii) | ජාතික තාක්ෂණ පැවරීම ඇතිකිරීම ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් (NNTI) | 520 | 302 |
| (iii) | Advance TT Programmes | 50 | නැත |
| (iv) | කළමනාකරණ පුහුණු වැඩසටහන් | 520 | 336 |

| | | | |
|---|---|---|---|
| (v) | විදාතා තාක්ෂණ පැවරුම් සහතික හා නිෂ්පාදන ඇතුළත්වීම් (Sticker) නිකුතුව ප්‍රතිලාභින් සංඛ්‍යාව | 500 | නැත |
| (vi) | ජංගම කඩ සැපයිම ප්‍රතිලාභීන් 50කට Providing portable stall | 50 | නැත |
| (vii) | Educational blog Prabashvara (Internet) blog posts | 2600 | 408 |
| (viii) | පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් | 1300 | 1042 |
| (ix) | Exploration & Mapping Local Resource (Resources Profiles) | 261 | 111 |
| (x) | තාක්ෂණ සම්බන්ධව ව්‍යාපෘති ඇතිකිරීම | 120 | නැත |
| (xi) | තාක්ෂණ සම්බන්ධව ව්‍යාපෘති ඇතිකිරීම - ජලය (ප්‍රතිලාභින්) | 150 | නැත |

**(ආ) සැලැසුම් කිරීම**

**----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

**---------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශය විද්‍යා සංවර්ධන වැඩසටහන යටතේ Technology market place ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රදර්ශනයක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණු අතර ඒ වෙනුවට අමාත්‍යාංශ මට්ටමේ ගත් තීරණයක් මත විද්‍යා සතියක් පවත්වා තිබුණි.

(ii) නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘතීන් හා විදාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන සළසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදි ඉන් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

## 3.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

**----------------------------------**

අමාත්‍යාංශයවිසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ප්ලාස්ටික් අපද්‍රව්‍ය මගින් පෙට්‍රෝලියම් ඉන්ධන බවට පරිවර්තනය කිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12 ක් ඇස්තමේන්තු කර තිබුණද. ඒ සඳහා රු.මිලියන 26 ක් සමාලෝචිත වර්ෂයේදි වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 12 ක් ඇස්තමේන්තු කර තිබුණත්, එම ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.මිලියන 26 ක් වැය කර තිබුණි.

(ii) ප්ලාස්ටික්වලින් ඉන්ධන නිපදවීමේ තාක්ෂණය සොයාගත්තේ යැයි සළකා එවැනි සංකීර්ණ රසායනික ක්‍රියාවලියක් පිළිබඳව අවබෝධයක් නොතිබුණු ව්‍යාපාරිකයකු වෙත සමාලෝචිත වර්ෂයේ රු.900,000 ක් හා ඉකුත් වසර දෙක සඳහා රු.1,800,000 ක් වශයෙන් රු.2,700,000ක් ගෙවීම් කර තිබුණි.

(iii) වර්තමානයේදි අමාත්‍යාංශය සතු පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම වෙත 2009 වර්ෂයේ සිට 2015 ජුනි 23 දින දක්වා කාලය තුළ රු.මිලියන 155.57 ක අරමුදල් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණද, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉන්ධන බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2015 ජුනි 23 දින වන විටත් අපොහොසත්වී තිබුණි. එම හේතුවෙන් මහජනතාවට ලැබිය යුතුව තිබූ ප්‍රතිලාභයක් අහිමිවී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් උපකරණ ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.මිලියන 348.4 ක් ස්ලින්ටෙක් සමාගම වෙත ගෙවා තිබුණි. එම උපකරණවල නඩත්තුව සඳහා පසුකාලීනව ගෙවිය යුතු රු.මිලියන 7.5 ක්ද මිලදී ගන්නා අවස්ථාවේදීම ගෙවා තිබුණි.

(ඇ) පරිගණක පද්ධතිය සඳහා භාවිතා කරන ලද (Used VGA Card )යොදා ගෙන තිබූ අතර ඒ හේතුවෙන් පරිගණක පද්ධතියේ ක්‍රියාකාරිත්වය ගැටළු සහගත විය.

## 3.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

අමාත්‍යාංශය යටතේ පවතින ග්‍රහලෝකාගාරයේ ප්‍රක්ෂේපණ යන්ත්‍රය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියට සමගාමීව ආයතනය විසින් ඉටුකර තිබූ රු.556,174 ක වියදම් සඳහා ප්‍රසම්පාදන පරිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) අධිකාරී බලය නොමැති ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය යටතේ ඇති පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගමේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වූ වැටුප් පරිමාණ තීරණය කිරීමට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදයට පටහැනිව අමාත්‍යාංශය යටතේ ඇති පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගමේ අවශ්‍යතා සඳහා 2014 මැයි මාසයේ සිට මාසිකව රු.105,000 ක් බැගින් වූ කුලියක් ගෙවීමේ පදනම මත වාහනයක් ලබාගෙන තිබුණි.

**3.8 පාඩු හා හානි**

අමාත්‍යාංශය විසින් ග්‍රහලෝකාගාරය සඳහා ප්‍රක්ෂේපන යන්ත්‍රයක් මිලදී ගැනීමේදී නියමිත කාල සීමාවලදී අදාළ කාර්යයන් නිම කර නොතිබීම නිසා රු.116,255ක විනිමය අලාභයක් සිදුවී තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 18 | 05 |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 768 | 657 | 111 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 234 | 234 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 02 | - |
| | **එකතුව** | **1,031** | **914** | **117** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාල පරිච්ඡේද |
|---|---|---|---|
| විද්‍යා හා තාක්ෂණ නිලධාරී | 01 | මූලික අධ්‍යයන ආයතනය | 2013.12.24 සිට |
| එම | 01 | ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය | 2012.11.01 සිට |
| එම | 01 | කාර්මික තාක්ෂණ ආයතනය | 2011.07.02 සිට |
| එම | 01 | ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානය | 2012.07.11 සිට |
| සංවර්ධන නිලධාරී | 01 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 2014.12.01 සිට |

**(ඇ) ක්ෂේත්‍ර නිලධාරීන් අමාත්‍යාංශයේ රඳවා ගැනීම**

ක්ෂේත්‍රයේ රාජකාරි කිරීම සඳහා බඳවා ගෙන තිබුණු විද්‍යාතා ක්ෂේත්‍ර නිලධාරීන් තිදෙනෙකු, විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානවල ක්ෂේත්‍ර නිලධාරීන් පුරප්පාඩුව පැවතියදී, අමාත්‍යාංශයේ විද්‍යාතා ශාඛාවේ කටයුතු සඳහා රඳවා ගෙන තිබුණි.